# වැඩකරන ජනතාව බිලිගන්නා



# IMF

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) රටවල්වලට ණය දීමට මුදල් ලැබෙන්නේ නව ලිබරල්වාදී ධනපතියන්ගෙනි. IMF එක එම මුදල් ණයට දීම ආරම්භ කරන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසුව 1947 සිටය. එදා සිට ණය මත සංවර්ධන ක්‍රියාදාමයේ පැමිණි සෑම රටක්ම 2025 වන විට විදේශීය මූල්‍ය ආයතනවලට ඩොලර් ට්‍රිලියන 304ක් ණය වී ඇත. මේ වන විට ලෝකයම ණය උගුලක සිරවී සෑම රටකම ආර්ථික අර්බුදය දැවැන්ත ලෙස වර්ධනය වෙමින් පවතී.

එම ණය උගුලේ හිර වූයේ තුන්වන ලෝකයේ රටවල් පමණක් නොවේ - ඇමරිකාව, කැනඩාව, චීනය සහ යුරෝපය වැනි නව ලිබරල්වාදී ආර්ථිකයේ සිටින ප්‍රබල රටවල් ද ණය උගුලේ හිරවී ඇත. ඇමරිකාව ණය වී ඇති මුදල ඩොලර් ට්‍රිලියන 36කි. වත්මනේ ඇමරිකාව එම ණය උගුලේ හිරවී රාජ්‍ය වියදම අඩු කිරීම සහ විදේශ භාණ්ඩවලට බදු පැනවීම මගින් ගොඩ ඒමට දඟලති. එය විසඳුමක් නොවන්නේ රැකියා කප්පාදුව මගින් මුදල් ඉතිරි කිරීම මගින් අභාවයට යන ධනේශ්වර ක්‍රමය පවත්වාගෙන යාමට විසඳුමක් එමගින් නොලැබෙන නිසාය. රාජ්‍ය වියදම් අඩු කිරීමේ කටයුත්ත නිසා ඇමරිකාවේ පමණක් ලක්ෂ 40ක ජනතාවක් පාරට වැටී (homeless) ඇත. ඔවුන් ඇමරිකාවේ සෑම නගරක් පාසාම විදිවල දිවි ගෙවනු දකින්නට හැකිය.

මේ ක්‍රියාවලිය ලංකාවේදී ද ඇරඹීමට වත්මනේ ජාතික ජන බලවේග (NPP) ආණ්ඩුව කටයුතු කරමින් සිටී. ලංකාවේ ආර්ථිකය 2022දී කඩා වැටුනේ ණය අර්බුදය නිසාය. 2022දී ලංකවේ විදේශ ණය ප්‍රමාණය සටහන් වූයේ ඩොලර් බිලියන 54ක් ලෙසය. ඉන් පසු ජනාධිපති බවට පත් වූ රනිල් වික්‍රමසිංහ අවුරුදු 2ක් තුළ එම ණය මුදල ඩොලර් බිලියන 110ක් දක්වා වැඩි කර යන්නට ගියේය. වත්මනේ NPP ආණ්ඩුව එම ණය මුදල වැඩි කිරීමට ඉන්දියාව, චීනය සහ විදේශ මූල්‍ය ආයතනවලින් ණය ගනිමින් සිටී. ඒ වගේම NPP ආණ්ඩුව ලංකාව ඇතුළත දේශීය ණය කන්දක් මාස හයක් තුළ ගොඩ ගසා ඇත. වත්මනේ NPP ආණ්ඩුව **'රාජ්‍ය වියදම් කප්පාදුව'** මගින් විසඳුමක් සොයා ගැනීමට තීන්දු ගනිමින් සිටිති. ඒ අනුව NPP ආණ්ඩුව විසින් ලංකාවේ රාජ්‍ය අංශයේ සේවකයන් ලක්ෂ පහමාරක් අඩු කිරීමට IMF එකට පොරොන්දු වීම මගිනි. එහි පළමු පියවර ලෙස මහවැලි අධිකාරිය සහ තවත් ආයතන පහක් වසා දමා සේවකයන් අඩු කර එමගින් නව ලිබරල්වාදී ක්‍රමය රැක ගැනීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටියි. වැඩකරන ජනතාව පාරට ඇද දමා කරන නව ලිබරල්වාදී ක්‍රමය බේරාගැනීමේ ඇමරිකාවේ විසඳුම් ක්‍රියාවලියම ලංකාවේදී ද NPP ආණ්ඩුව ද ක්‍රියාත්මක කරමින් සිටියි.

මාක්ස්වාදීන්ගේ මූලික කර්තව්‍ය වූයේ පංතිය ආරක්ෂා කිරීමය. IMF මර උගුලෙන් ගැලවීමේ උපයා මාර්ගික පිවිසුමක් ලෙස අදහස් කරන්නේ වැඩකරන පංතිය බේරාගැනීමය. ලංකාවේදී එහි වගකීම පැවරෙන්නේ සමස්ත වමේ ව්‍යාපාරය වෙතටයි. එය වමේ එක්සත්කමකින් භාර ගත යුතු කටයුත්තකි. ඒ ගැන **'එක්සත් වමක් සඳහා වූ ක්‍රියාකාරීත්වය'** විසින් සංවිධානය කරන දෙවැනි රැස්වීම ජූනි මස 05වැනි බ්‍රහස්පතින්දා සවස 4.30ට පවත්වන්ට අපි තීන්දු කළෙමු. වැඩකරන ජනතාව හා වමේ ක්‍රියාධරයින් වන අපි සියලු දෙනාම එකතු වී සාකච්ඡා කරමු.

**මුලසුන**

වසන්ත දිසානායක

**දේශන**

- බන්දුල නානායක්කාර
- ඩී. එම්. ඩී. අබේරත්න
- දිශාන් ධර්මසේන

**ජූනි 05 සවස 4.30ට**

**දුම්රිය සේවක සංගම් කාර්යාලයේදී**

දුම්රිය පටුමග, මරදාන, කොළඹ 10.

☎ 071 441 6010, 011 2678315 (අබේරත්න)

Zoom තාක්ෂණය මගින්ද සම්බන්ධ වීමට 071 441 6010 අංකයට Whatsapp පණිවිඩයක් යොමු කරන්න.

**එක්සත් වමක් සඳහා වූ ක්‍රියාකාරීත්වය**

දුම්රිය සේවක සංගමය